සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

05

RICHMOND COLLEGE LIBRARY
GALLE

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 8 ශ්‍රේණිය
## ඉස්ලාම් ධර්මය

**නම/විභාග අංකය :-** ..............................................................................

**කාලය : පැය 02 යි.**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- ඉතා නිවැරදි පිළිතුර තෝරන්න.

01. අල්ලාහ්ගේ කරුණාව දක්වන අලංකාර නාමයකි.
(1) අල් අළීම් (2) අල් කාලික් (3) අල්හකීම් (4) අර්රහීම්

02. වහි ගෙරු මත්ලුව් පදනමින් හිමිවූ නීති මූලාශ්‍රය.
(1) අල්කුර්ආන් (2) අල් හදීස් (3) අල් ඉජ්මඃ (4) අල්කියාස්

03. සලාත්හි සිදුවන අමතකවීම සඳහා ඉටුකරනු ලබන සුජුදය,
(1) සජ්දා තිලාවත් (2) සජ්දා ෂුක්ර් (3) සජ්දා සහ්වු (4) සජ්දා හාජා

04. ඉස්ලාමීය ආර්ථිකයේ ජීවය වන්නේ,
(1) සත්කාත් (2) හජ් (3) සලාත් (4) සෞම්

05. සූරා ෆාතිහාවේ අවසාන දිනය දක්වන පදය,
(1) යව්මුල් ආඛිර් (2) යව්මුල් බඃස් (3) යව්මුල් හිසාබ් (4) යව්මුද්දීන්

06. කුර්ආන්හි අඩංගුවන මන්සිල් ප්‍රමාණය,
(1) 30 (2) 07 (3) 15 (4) 114

07. 'ඉත්ලාස්' යන පදයෙහි තේරුම,
(1) දේවබිය (2) රැකීම (3) පිරිසිදු චේතනාව (4) හොඳ විනය

08. 'අල් මාඌන්' යන්නෙහි අදහස,
(1) අල්ප වස්තූන් (2) ලේ කැටිය (3) අළුයම (4) ඕපාදූප

09. නබි (සල්) ගේ වචන, ක්‍රියා, අනුමත කිරීම් එක් වූ ගොනුව,
(1) ඉජ්තිහාද් වේ. (2) ඉජ්මඃ වේ. (3) හදීස් වේ. (4) අල්කුර්ආන් වේ.

10. දෙවෙනි අන්තහියියාත් හිඳුම,
(1) ජුලුස් (2) තවර්රුක් (3) ඉෆ්තිදාල් (4) ඉස්තිරාහත්

11. ''පවෙන් අපව මුදවාගන්නා මාසය, ඔබගේ පැමිණීම සුභවේවා'' යනුවෙන් පැවසූ සහභිවරයා,
(1) අබු බර්ක් (රළි) (2) අලි (රළි) (3) උස්මාන් (රළි) (4) ඉබ්නු උමර් (රළි)

12. අනිවාර්යයෙන් ජමාඅත් වශයෙන්ම ඉටු කළ යුතු සලාතය,
(1) ෆජ්ර් සලාත් (2) ග්‍රහණ සලාත් (3) ජුම්ආ සලාත් (4) ඊද් සලාත්

13. "නබිවරුන්ගෙන් අවසානවන්තයා" යන තේරුම දෙන අරාබි වහර,

(1) කාතමුන් නබියියීන් (2) සෙයිදුල් මුර්සලීන්

(3) සෙයිදුල් අන්බියා (4) රහ්මතුන් ලිල්ආලමීන්

14. ෂහාදා කලිමාවෙන් පසුව ප්‍රධාන වගකීම,

(1) සලාත් (2) සකාත් . (3) උපවාසය (4) හජ්

15. "නියත වශයෙන් අල්ලාහ්ගේ ගැත්තන් අතරින් ඔහුට බැතිමත්වන්නේ විද්වතුන් වේ" යනු,

(1) හදීසයකි. (2) කුර්ආන් වැකියකි.

(3) විද්වතු අදහසකි. (4) ඉමාම් අබුහනීෆාගේ වදනකි.

16. කුර්ආනීය ප්‍රකාශය අනුව ලැජ්ජා සහිත ක්‍රියා සහ පිළිකුල් සහගත ක්‍රියාවන්ගෙන් වළක්වන ඉබාදතය.

(1) සකාත් (2) සදකා (3) සවුම් (4) සලාත්

17. මස්ජිදයට ඇතුල්වන විට උසුරණ දුආව,

(1) අල්ලාහුම්මජ්අල් ෆී කල්බී නූරා (2) අල්ලාහුම්මෆ්තහ්ලී අබුවාබ රහ්මතික

(3) අල්ලාහුම්ම ඉන්නී අස්අලුක මින් ෆල් ලික (4) අල්ලාහුම්ම ජ්අල්නී මිනත් තෞව්වාබීන්

18. ෆර්ළු වෙන් වූ සලාතය,

(1) බාරවූ සලාත් (2) ජනාසා සලාත් (3) ග්‍රහණ සලාත් (4) තහජ්ජුද් සලාත්

19. 'සුබ්හාන රබ්බියල් අඃලා වබිහම්දිහී' යන තස්බීහය උසුරණ අවස්ථාව,

(1) ආරම්භක තක්බීරය සමඟ (2) ඉඃතිදාල් හි

(3) රුකූඃ හි සිටින විට (4) සුජූද් හි සිටින කල

20. සිකුරාදා දිනයෙහි පාරායනා කරන මෙන් නබිතුමා විධානය කොට , නම් කළ සූරාව,

(1) සූරා හිජ්ර් (2) සූරා හජ් (3) සූරා කහ්ෆ් (4) සූරා තෞබා

## II කොටස

- **කොටස් 'අ' , 'ආ' අතරින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් බැගින් තෝරා , පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළවෙනි ප්‍රශ්නයට ලකුණු '16' ක්ද, අනෙකුත් එක් එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු '11' ක් බැගින් ද හිමි වේ.**

01. පාසල් පාදක ඇගයීම ක්‍රියාවලියෙහි "නබිවරු සහ රසූල්වරු" යන තේමාව යටතේ ඔබ විසින් ඉටු කරනු ලද පැවරුම පදනම් කරගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) නබිවරු යනු කවරේද?

(2) 'උළුල් අස්ම්' නබිවරුන්ව නම් කරන්න.

(3) ආගම් ප්‍රදාන කරන ලද නබිවරුන් සහ එම ආගම් නම් කර දක්වන්න.

(4) මූසා (අලෛ), දාවූද් (අලෛ), මුහම්මද් (සල්) යන නබිවරුන්ට ප්‍රදාන කරන ලද මුඃජිසාත් සඳහන් කරන්න.

(5) නබිවරුන් තුළ දක්නට හැකි උසස් ගුණාංග 5ක් සඳහන් කරන්න.

(6) ආදම් (අලෛ), ඉබ්රාහීම් (අලෛ), මූසා (අලෛ), ඊසා (අලෛ) යන නබිවරුන් සිව්දෙනාගේ ගරුනාමයන් නම් කරන්න.

## 'අ' කොටස

02. (1) දිනපතා ඉටුකළ හැකි සුන්නත් සලාත් දෙකක් නම් කරන්න.

(2) ඉස්ලාමීහි මූලික විශ්වාසයන් තුන කුමක්ද?

(3) සලාතය නිසි ලෙස ඉටුකරන්නා මෙලොවේ අත්කර ගන්නා ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

(4) ආදරය ලක්නොවූ දරුවන් තුළ ඇතිවන නරක බලපෑම් තුනක් සඳහන් කරන්න.

03. (1) සකාත් යන අරාබි පදයෙහි අරුත් දෙකක් ලියන්න.

(2) ප්‍රාර්ථනාව සඳහා සුදුසු අවස්ථා තුනක් සඳහන් කරන්න.

(3) දුර්ගුණාංග මඟින් ඇතිවන්නාවූ බලපෑම් තුනක් සඳහන් කරන්න.

(4) රමළාන් මසෙහි අත්කරගත හැකි ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

04. (1) පරමාන්ථ දිනයෙහි විනිශ්ච කරන විට ඉදිරිපත් කරන සාක්ෂි දෙකක් සඳහන් කරන්න.

(2) කුර්ආන් පරායනා කිරීම මඟින් අත්වන යහඵල තුනක් සඳහන් කරන්න.

(3) සලාත්හි ෆර්ළ් වූ පරායනා තුනක් සඳහන් කරන්න.

(4) අල්ලාහ්ගෙන් පමණක් උදව් පැතීමෙන් සිදුවන යහපත් තුනක් සඳහන් කරන්න.

## 'ආ' කොටස

05. (1) 'දුආ' යන අරාබි පදයෙහි භාෂාමය අරුත් දෙකක් ලියන්න.

(2) ආලිම්වරුන්ට ගරු කළ යුතු ආකාර තුනක් සඳහන් කරන්න.

(3) බාලවියන් වැඩිහිටියන්ගෙන් බලාපොරොත්තු වන කරුණු තුනක් සඳහන් කරන්න.

(4) 'අල් කුර්ආන්' අවසාන ආගම වේ' යන්නට සාධක තුනක් ඉදිරිපත් කරන්න.

06. (1) පාප ක්‍රියාවන්හි කොටස් දෙක නම් කරන්න.

(2) සලාත් හි සුන්නත්වූ පරායනා තුනක් සඳහන් කරන්න.

(3) රමළාන් මාසයේ කළ යුතු අමල් තුනක් සඳහන් කරන්න.

(4) ගමනකට සූදානම් වන විට , ඉස්ලාම් දක්වා තිබෙන අයුරු රැකිය යුතු පිළිවෙත් තුනක් සඳහන් කරන්න.

07. (1) හදිස් හි ප්‍රධාන කොටස් දෙක සඳහන් කරන්න.

(2) අල්ලහ් හාරසූල්වරයා විසින් තහනම් කරන ලද මහාපාපයන්ගෙන් තුනක් සඳහන් කරන්න.

(3) සකාත්, සදකා අතර පවතින වෙනස්කම් තුනක් වගුවකින් පහදන්න.

(4) සලාතය නිසි අයුරින් ඉටුකරන පුද්ගලයා පරමාන්ථයේ අත්කරගන්නා ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.